# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
# ජනරජයේ ගැසට් පත්‍රය


## 2015 නොවැම්බර් මස 27 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2015. 11. 30 දින නිකුත් කරන ලදී)**


## කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව
## (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ)

**කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

''කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංවර්ධන සභාවක් එහි සාමාජිකයන් විසින් එකඟ වී ඇති රීති අනුව එකී සංවර්ධන සභාවට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරනු එළදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංවර්ධන සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංවර්ධන සභාව විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද සහ එම සභාව සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කොටසර පියංගල රාජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''සංවර්ධන සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාවේ තත්කාලීන සාමාජිකයන් හා මින් මතු මෙයින් ස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ව බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

2—PL 009417— 300 (2015/11)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාවට අනුබද්ධ වැගම ශ්‍රී සද්ධර්මාලංකාර විද්‍යායතනය, වැගම ශ්‍රී සෝභිත ධර්මායතනය, මාපාකඩ සුදර්ශනාරාමය, කොටසර විහාරස්ථ කාර්යසාධක සමිතිය, කොටසර ශ්‍රී ස්වර්ණජෝති දහම් පාසල, කොටසර මහා පෙරහැර සංවිධානය, කොටසර සතර පේරුවේ අවමංගල්‍යාධාර සමිති සඳහා අවශ්‍ය දෑ සැපයීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම, බෞද්ධ ජනතාව තුළ ශාසනික ප්‍රබෝධය ඇති වන සේ කටයුතු සංවිධානය කිරීම සහ ප්‍රදේශවාසීන්ගේ සමාජ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීම ;

(ආ) ඉහත සඳහන් කොටසර විහාරස්ථ නව ධර්ම ශාලාව වළාකුළු බැම්ම හා වාහල්කඩ ඉදි කිරීම මෙම ආයතනය පිහිටි ආරාම භූමියේ පළතුරු උයනක් ආරම්භ කිරීම ඇතුළු ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත්කමක් ඇති ස්ථානයක් බවට ආරක්ෂා කර සංවර්ධනය කිරීම;

(ඇ) ප්‍රදේශයේ දිළිඳු හා අසරණ අය සඳහා නිවාස සෞඛ්‍ය පහසුකම් පිරිසිදු පානීය ජලය අවශ්‍යතාවන් සපුරාලීම;

(ඈ) අදාළ දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ලබන දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීමට පහසුකම් සැපයීම ;

(ඉ) සාමාජිකයන්ගේ ආගමික, සංස්කෘතික, සාමාජික හා සෞඛ්‍යමය සුභසාධන සේවා පවත්වාගෙන යාම, ඒවාට ධෛර්ය දීම සහ ආධාර කිරීම ;

(ඊ) බුද්ධ ධර්මය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම;

(උ) ගිලන් භික්ෂූන් සඳහා ආරෝග්‍ය ශාලාවක් ආරම්භ කිරීම සහ වනවාසී සියලු භික්ෂූන්ට වෛද්‍ය පහසුකම් සැලසීම ;

(ඌ) භික්ෂූන්ට ධර්මය සහ විනය ඉගැන්වීම, යෝගාභ්‍යාස පුහුණු කිරීම, පාලි, සිංහල සහ වෙනත් පෙර අපර භාෂා පිළිබඳ ප්‍රවීණත්වය ලබා දීම ;

(එ) බාල පරපුරට ධර්මඥානය ලබා දීම සඳහා දහම් පාසල් පිහිටුවීම ;

(ඒ) ලෝක සාමය උදෙසා බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල අන්තර්ගත පණිවුඩය සහ බෞද්ධ සංස්කෘතිය පතුරුවා හැරීම.

(ඔ) අධ්‍යාපනය, සංස්කෘතිය, සන්නිවේදනය, නිරුපද්‍රිත පැවැත්ම, සංවර්ධනය හා සාමය පිළිබඳ ලෝක ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය සංවිධාන වන හෝ නොවන ආගමික හෝ ගිහි ජාත්‍යන්තර සංවිධාන මගින් කැඳවනු ලබන සම්මන්ත්‍රණවල දී හා සම්මේලනවල දී බෞද්ධ ප්‍රජාව වෙනුවෙන් බෞද්ධ මතය ඉදිරිපත් කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ සාමාජිකයා වන ගරු කොටසර පියංගල රජමහා විහාරයේ වැගම ශ්‍රී නන්දිරාමාධිපති වන බදුල්ල ගම්මන ගුණරතන හිමි අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු ය. සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද,

ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කරගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ දේවල්, ඉටු කිරීමේ සහ කාරණා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) නිලතල දරන්නන් තෝරා පත් කිරීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන් ගේ බලතල, පැවැත්ම සහ කාර්යය ;

(ඇ) කළමනාකාර කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්යය ;

(ඈ) සංස්ථාවේ කළමනාකාර කමිටුවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම, එම රැස්වීම් පැවැත්විය යුතු වේලාව, ස්ථානය ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ එහි දී කටයුතු කර ගෙන යාම ; සහ

(ඉ) සංස්ථාවේ විවිධ නිළධරයන්ගේ අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම කාර්යය සහ කර්තව්‍ය ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් තැබීම හා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**7.** මේ පනත ක්‍රියාත්මකවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සභාවෙහි පවත්නා සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සභාවට ගෙවිය යුතු සියලු ණය ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සභාව විසින් සහ සභාවට ගෙවිය යුතු ණය.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, බද්දක්, හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** කළමනාකාර කමිටුවේ සාමාජිකයකු සහ ගරු ලේකම්වරයා හෝ කළමනාකාර කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.